# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2003 අංක 37 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 නොවැම්බර් මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 නොවැම්බර් මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 36.50 යි. තැපැල් ගාස්තුව : රු. 11.25 යි.

## 2003 අංක 37 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 නොවැම්බර් මස 14 වන දින]

එල්. ඩී.– ඕ. 19/2003.

### 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත, 2003 අංක 37 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2000 අංක 38 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. මෙහි (මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන,) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 2 වන වගන්තිය, එහි "මේ පනතේ පළමුවන, දෙවන සහ තුන්වන උපලේඛනවල සඳහන්" යන වචන වෙනුවට "මේ පනතේ පළමුවන, දෙවන, තුන්වන, හතරවන, පස්වන හා හයවන උපලේඛනවල සඳහන්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ-

(1) (ඇ) ඡේදයේ අතුරු විධානයේ "නොසලකා හැරිය යුතු ය." යන වචන වෙනුවට "නොසලකා හැරිය යුතු ය ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ අතුරු විධානයෙන් ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ඉ) සේවායෝජකගෙන් හෝ සේවායෝජක වෙනුවෙන් එම සේවා නියුක්තියට අදාළව වෙනත් තැනැත්තකුගෙන් නොමිලයේ හෝ එම කොටස්වල එවකට පවත්නා වෙළෙඳපළ වටිනාකමට වඩා අඩු මිළකට, ප්‍රතිලාභයක් ලෙස කෙලින්ම හෝ කොටස් මනාප ක්‍රමයක් යටතේ ලැබුණු සමාගම් කොටස් බැහැර කරන අවස්ථාවේ දී ඒවායේ වටිනාකම ;

යම් කොටසක් බැහැර කරන අවස්ථාවේ දී එහි වටිනාකම යන්නෙන් ඒ කොටස අත්කර ගැනීමේ පිරිවැය ඉක්ම වූ–

(i) විකිණීමක් සම්බන්ධයෙන් වන විට, එය විකුණන දිනයේ දී එහි විකුණුම් මිල හෝ වෙළෙඳපොළ වටිනාකම යන මෙයින් වඩා ඉහළ වටිනාකම ;

(ii) විකිණීමෙන් හැර අන්‍යාකාරව බැහැර කරන අවස්ථාවක, එම කොටස එසේ බැහැර කරන දිනයේ දී පැවති එහි වෙළෙඳපළ වටිනාකම ;

(iii) එම කොටස විකිණීමෙන් හෝ බැහැර කිරීමෙන් තොරව සේවා නියුක්තයකු සේවා නියුක්තියේ යෙදීම නතර වූ අවස්ථාවක, එම කොටස බැහැර කරන ලද දිනය සේ සලකනු ලබන ඔහු ඒ සේවා යෝජකගේ සේවානියුක්තියේ සිටි අවසන් දිනට එම කොටසෙහි වෙළෙඳපොළ වටිනාකම,

අදහස් වේ :

එසේ වුව ද, ඒ සේවා යෝජකගේ සේවා නියුක්තියේ යෙදී සිටිය දී සේවා නියුක්තයා මියගිය විටක, එම කොටසක වටිනාකම ශුන්‍ය විය යුතු ය.

එම විකිණීම හෝ බැහැර කරනු ලැබීම හෝ සේවා නියුක්තිය නතරවීම සිදුවූයේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ වර්ෂයේ දී මීට ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව උද්ගතවන සේවා නියුක්ති ලාභවලින්, මේ ඡේදයේ කාර්ය සඳහා එම ලාභ ඒ තක්සේරු වර්ෂය සඳහා VII වන පරිච්ඡේදයේ අර්ථානුකූලව වූ එකම බදු අයකළ හැකි ආදායමය යන පදනම මත ආදායම් බදු අයකළ යුතු අතර එම බද්ද මේ පනතේ XIV වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව අයකරගත යුතු ය :

එසේ වුව ද, එම කොටස බැහැර කිරීමට සේවායෝජක සාධක නොවූ අවස්ථාවක, ඒ සේවා නියුක්තයා එම සේවා නියුක්ති ලාභයෙන් අයවිය යුතු බද්ද මේ පනතේ XIII වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ගෙවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. 2002 අංක 10 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි (ඊ) ඡේදයේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ" යන වචන වෙනුවට, "2003 අප්‍රේල් 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5.** 2001 අංක 8 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "යම් තක්සේරු වර්ෂයක් තුළ" යන වචන වෙනුවට "2003 අප්‍රේල් 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයේ "ඒ තක්සේරු වර්ෂය සඳහා සේවා නියුක්තිය හැර වෙනත් සියලු ප්‍රභවයන්ගෙන්" යන වචන වෙනුවට "2003 අප්‍රේල් 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සේවා නියුක්තිය හැර වෙනත් සියලු ප්‍රභවයන්ගෙන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**6.** 2002 අංක 10 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ඊ) ඡේදයේ "හෝ 21ආ වන" යන වචන හා ඉලක්කම් වෙනුවට "21ආ වන, 21ඇ වන, 21ඈ වන' 21ඉ වන, 21 ඊ වන, 21උ වන හෝ 21ඌ වන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ඌ) ඡේදයේ "ඉන් පසු එක් වර්ෂයක් තුළ නම්" යන වචන වෙනුවට "ඉන් පසු එක් වර්ෂයක් තුළ නම්;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තිය අගට, මෙහි පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

"(එ) ඒකක භාරයක හෝ අන්‍යොන්‍ය අරමුදලක කොටස් හිමියකුට 2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව, ඒ ඒකක භාරයෙන් හෝ අන්‍යොන්‍ය අරමුදලින් බදු අයකළ හැකි ආදායමින් ගෙවන ලද යම් ලාභාංශයක්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "යම් නිවාසයක් හුදෙක් වාසය කිරීමේ කාර්යය සඳහා" යන වචන වෙනුවට,

"2003 අප්‍රේල් 1 වන දිනට පෙරාතුව ඉදි කරන ලද යම් නිවාසයක් හුදෙක් වාසය කිරීමේ කාර්යය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළු කිරීමෙන් :-

"(1අ) 2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ඉදිකරන ලද යම් නිවසක අයිතිකරුහට, ඒ නිවස තනිකරම වාසික කාර්ය සඳහා යොදාගෙන ඇත්නම්, ඒ නිවස ඉදිකිරීම සම්පූර්ණ කළ තක්සේරු වර්ෂයට හා ඉන් ඉක්බිතිව ම එළඹෙන අනුක්‍රමික තක්සේරු වර්ෂ හතර සඳහා උපචිත වන ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** 2001 අංක 8 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (අඅ) ඡේදයේ "2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ ශ්‍රී ලංකාවෙන් පිටත, (ඉදිකිරීමේ යෝජනා සම්බන්ධ සේවාවන් ඇතුළත්ව)" යන වචන හා ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(i) ඒ සමාගම හෝ හවුල් ව්‍යාපාරය විසින් ඒ තක්සේරු වර්ෂයේ දී ශ්‍රී ලංකාවෙන් පිටත දී (යම් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් සඳහා ඉටු කරන ලද සේවාවන් ද ඇතුළුව) ඉටු කරන ලද සේවා වෙනුවෙන් 2001 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ;

(ii) ශ්‍රී ලංකාවේ දී තැනූ හෝ නිෂ්පාදිත යම් භාණ්ඩ සහ ශ්‍රී ලංකාවට ආනයනය කළ යම් භාණ්ඩවලට කිසිම ආකාරයකින් සම්බන්ධ නොවන යම් අක් වෙරළ ව්‍යාපාර වෙනුවෙන්, 2003 අප්‍රේල් 01 වන දින හෝ ඉන්පසුව." ; සහ

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "තොරතුරු සපයන්නකු විසින් තිළිණයක් වශයෙන්" යන වචන වෙනුවට "යම් තොරතුරු සපයන්නකු විසින්, 2003 අප්‍රේල් 1 වන දිනට පෙර තිළිණයක් වශයෙන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ වගන්තිය සංශෝධනය කිරීම.

**9.** 2003 අංක 19 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා සමාගමකට අදාළව "නිශ්චිත ව්‍යවසාය" යන්නෙන්-

(අ) රුපියල් මිලියන දෙකහමාරකට නොඅඩු ආයෝජනයක් සහිතව ආරම්භ කරන ලද්දා වූ සහ කෘෂිකර්මාන්තය, කෘෂි පිරිසැකසුම් කිරීම, කාර්මික හා යාන්ත්‍රික මෙවලම් නිෂ්පාදනය, විද්‍යුතය, සම්ප්‍රදායික නොවන නිෂ්පාදිත අපනයනය හෝ තොරතුරු තාක්ෂණය සහ සමාන්තර සේවාවෙහි යෙදී සිටින 2002 අප්‍රේල් 1 වන දිනට පෙර සංස්ථාගත කරන ලද යම් සමාගමක් විසින් 2002 අප්‍රේල් 1 වන දින දී හෝ ඉත් පසු අලුත් ව්‍යවසායක් ලෙස ආරම්භ කරන ලද ව්‍යවසායක් හෝ 2002 අප්‍රේල් 1 වන දින හෝ ඉත් පසුව සංස්ථාගත කළ සමාගමක් විසින් ඉහත සඳහන් කටයුතු කරගෙන යන ව්‍යවසායක් ;

(ආ) (i) රුපියල් මිලියන දෙකහමාරකට නොඅඩු ආයෝජනයක් සහිතව ආරම්භ කරන

ලද්දා වූ ද, 2002 අප්‍රේල් 1 වන දිනට පෙර සංස්ථාගත කරන ලද යම් සමාගමක් විසින් 2002 අප්‍රේල් 1 වන දින දී හෝ ඉන් පසු අලුත් ව්‍යවසායක් ලෙස ආරම්භ කරන ලද හෝ 2002 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව සංස්ථාගත කළ සමාගමක් විසින් කරගෙන යන යම් නම් කරන ලද ව්‍යාපෘතියක් ; හෝ

(ii) රුපියල් මිලියන දෙසිය පණහකට වැඩි ආයෝජනයක් සහිත,

සහ නියමිත මාර්ගෝපදේශවලට අනුකූල ව්‍යවසායක් අදහස් වේ :

එසේ වුව ද, (ආ) ඡේදයේ (1) වන අනුඡේදයේ සඳහන් ආයෝජනයේ මුදල යම් අපනයන නිෂ්පාදන ගම්මාන සමාගමකට අදාළ නොවිය යුතු ය.

යම් නිශ්චිත ව්‍යවසායක ආදායමට අමතරව වෙනත් යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් ආදායම් ලබන සමාගමක් සම්බන්ධයෙන් වන විට මෙම වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කිරීම, අදාළ නිශ්චිත ව්‍යවසායෙන් ලබන ලාභ හා ආදායම්වලට පමණක් අදාළ විය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා–

(i) "කෘෂිකර්මාන්තය" යන්නෙන්, කවර හෝ විස්තරයකට අයත් ශාඛ වර්ග ඉඩම්වල වගා කිරීම සහ මසුන් ඇති කිරීම අදහස් වේ ;

(ii) "සාම්ප්‍රදායික නොවන නිෂ්පාදිත අපනයනය" යන්නෙන්, 49 වන වගන්තියේ අර්ථානුකූලව සැලකෙන අපනයනය කිරීම් ඇතුළුව, 52 වන වගන්තියේ අර්ථකථනය කර තිබෙන යම් භාණ්ඩ යම් තක්සේරු වර්ෂයක් සඳහා ව්‍යවසායේ මුළු පිරිවැටුමෙන් සියයට අසූවකට නොඅඩුව අපනයනය අදහස් වේ." .

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 21ද වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර ඒවා ඒ ප්‍රඥප්තියේ 21දෟ වගන්තිය සහ 21ඵ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21දෟ සහ 21ඵ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"යම් අවදානම් ප්‍රාග්ධන සමාගමක් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

21දෟ. (1) (2) වන උපවගන්තියේ සඳහන් යම් අවදානම් ප්‍රාග්ධන සමාගමක (2.3 වන වගන්තියේ) (7) වන උපවගන්තියේ (ආ) ඡේදයේ අර්ථානුකූල ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබූ ලාභ සහ ආදායම් හැර, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභ සහ ආදායම් ඒ සමාගම විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් මුදල් ප්‍රමාණයක් ආයෝජනය කරන්නා වූ හා ඒ ආයෝජනය -

(i) පුරෝගාමී ස්වභාවයේ ව්‍යාපෘතියක් වන සහ අගය එකතුවීම හා ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනයවීම ඒ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වයෙහි ප්‍රතිඵලය වන ව්‍යාපෘතියක යෙදී සිටින ;

(ii) තොරතුරු තාක්ෂණ ව්‍යාපාරයක් වන ව්‍යාපෘතියක යෙදී සිටින ;

(iii) 21ඉ වගන්තියේ අර්ථානුකූලව, අක්‍රිය හෝ ඌන ක්‍රියාකාරිත්වයෙන් යුත් කර්මාන්ත පුනරුත්ථාපනයට සම්බන්ධ ව්‍යාපෘතියක් වන ; හෝ

(iv) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් නිශ්චය කොට දක්වනු ලැබිය හැකි වෙනත් යම් ව්‍යාපෘතියක යෙදී සිටින,

සමාගමක සාමාන්‍ය කොටස් මිල දී ගැනීම සඳහා කරන නිශ්චිත ආයෝජනයක් ලෙස හඳුනා ගැනෙන ආයෝජනයක් වන හා ඒ ආයෝජනය, නව ව්‍යාපාර සඳහා බීජ ප්‍රාග්ධනය සැපයුමකින් හෝ ආරම්භක ප්‍රාග්ධන සැපයුමකින් හෝ මුල් අවධියේ මූල්‍යකරණ පහසුකම් සැපයුමකින් මූල්‍ය පහසුකම් සැපයීම වන්නේ නම්, ඒ සමාගමේ වාණිජ ව්‍යාපාර කටයුතු

කරගෙන යාම ආරම්භ කළ තක්සේරු වර්ෂයේ සිට අවුරුදු පහක කාලසීමාවකට ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද –

(අ) අවදානම් ප්‍රාග්ධන සමාගම 2003 අප්‍රේල් 1 වන දිනට ප්‍රථම වාණිජ ව්‍යාපාර කටයුතු ආරම්භ කර නොමැති විය යුතු ය ; තවද

(ආ) නිශ්චිත ආයෝජනය, ප්‍රථම ආයෝජනය කරන අවස්ථාව වන විට 1982 අංක 17 දරන සමාගම් පනතේ අර්ථානුකූල ආශ්‍රිත සමාගමක් වන සමාගමකට අදාළව කරන ලද්දක් නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා තිබෙන සහනය සඳහා සුදුසුකම් ලැබීම පිණිස, එම අවදානම් ප්‍රාග්ධන සමාගම විසින් –

(i) වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ වර්ෂයේ සිට දෙවන වර්ෂයේ අවසානයේ දී හෝ ඊට ප්‍රථම ඒ සමාගමේ මුළු කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනයේ ප්‍රමාණයෙන් සියයට හතළිහකට නොඅඩු ප්‍රමාණයක් ;

(ii) වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ වර්ෂයේ සිට තුන්වන වර්ෂය අවසානයේ දී හෝ ඊට ප්‍රථම, එම සමාගමේ මුළු කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනයේ ප්‍රමාණයෙන් සියයට අසූවකට නොඅඩු ප්‍රමාණයක් ;

(iii) වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ වර්ෂයේ සිට හතරවන හා පස්වන වර්ෂවල අවසානයේ දී හෝ ඊට ප්‍රථම එකී හතරවන හා පස්වන වර්ෂ ඇතුළත එම සමාගමේ මුළු කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධන ප්‍රමාණයෙන් සියයට අසූවකට නොඅඩු ප්‍රමාණයක් ;

(1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන යම් ව්‍යාපෘතියක ආයෝජනය කරනු ලැබ තිබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තිය යටතේ නිදහස ඉල්ලා සිටි සමාගමක් මේ උපවගන්තියේ විධිවිධානවලට අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, හෝ වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ වර්ෂය හා ඉන් පසුව එළඹෙන වර්ෂය තුළ ලාභාංශ ප්‍රකාශකර ඇත්නම් මේ වගන්තිය මගින් සලසා දෙන ලද නිදහස ඉවත් කරගන්නා අතර අදාළ වර්ෂ සඳහා තක්සේරු නිකුත් කරනු ලැබේ.

(3) විදේශීය සමාගම්වල ද ආයෝජනය කරනු ලැබිය හැකි අතර එම ආයෝජන, ඒ සමාගම වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ තක්සේරු වර්ෂයේ සිට පිළිවෙළින් දෙවන වර්ෂයේ එම සමාගමේ ස්කන්ධ හා කොටස් ප්‍රාග්ධනයෙන් සියයට දහයකට වැඩි නොවන සහ තුන්වන වර්ෂයේ සහ ඉන් පසු වර්ෂවල එම සමාගමේ ස්කන්ධ හා කොටස් ප්‍රාග්ධනයෙන් සියයට විස්සකට වැඩි නොවන අවස්ථාවක, ඒ සමාගම වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ තක්සේරු වර්ෂයේ දී සහ ඉන් පසුව එම ආයෝජනය මේ වගන්තියේ කාර්ය සඳහා නිශ්චිත ආයෝජනයක් ලෙස සැලකිය යුතු ය.

(4) එම සමාගම වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ තක්සේරු වර්ෂය ද ඇතුළුව, ප්‍රථම අවුරුදු තුන ඇතුළත, මේ වගන්තියේ (2) වන උපවගන්තියෙන් නියමිත අවම ආයෝජන ප්‍රමාණය ඉක්මවන කොටස් මුදල් ප්‍රාග්ධන ප්‍රමාණයක් ආණ්ඩුවේ සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලැබිය හැකි අතර එම ආයෝජනය නිශ්චිත ආයෝජනයක් ලෙස සැලකිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා "අවදානම් ප්‍රාග්ධන සමාගම" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද රුපියල් මිලියන එක් සියයක නිකුත් කළ කොටස්

ප්‍රාග්ධනයක් ඇත්තා වූ ද (1) වන, (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල නිශ්චිතව සඳහන් පරිදි වූ ව්‍යාපෘතියක් හා සම්බන්ධව කොටස් ප්‍රාග්ධන ආයෝජන සැපයීමේ ව්‍යාපාරයෙහි යෙදී සිටින්නා වූ ද-

(i) අදාළ ආයෝජන ක්ෂේත්‍රයෙහි නියමිත පළපුරුද්ද ඇති කළමනාකරණ සමාගමක් සමග තාක්ෂණික සේවා ගිවිසුමකට ඇතුළත් වී ඇත්තා වූ ; හෝ

(ii) විදේශීය අවදානම් ප්‍රාග්ධන සමාගම් විසින් පුහුණු කරනු ලැබූ වෘත්තීය කාර්ය මණ්ඩලයක් සහ අවශ්‍ය වෘත්තීය අවදානම් ප්‍රාග්ධන කළමනාකරණ පළපුරුද්ද සහිත වෙනත් දේශීය කාර්ය මණ්ඩලයක් සිය සේවා නියුක්තියෙහි ඇත්තා වූ ද,

සමාගමක් අදහස් වේ.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා, වාණිජ ව්‍යාපාර කටයුතු ආරම්භ කළ තක්සේරු වර්ෂය වන්නේ අවදානම් ප්‍රාග්ධන සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධන රුපියල් මිලියන සියයක් බවට පත් වූ වර්ෂය වන අතර 2008 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමකට එය අදාළ නොවිය යුතු ය.".

සංචාරකයන් සඳහා වලව් නිවාස හෝ විශේෂ සංවර්ධිත බංගලා සැපයීමේ ව්‍යාපාරයෙහි නියුක්ත යම් තැනැත්තකු ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

21ඵ. (1) (2) වන උපවගන්තියේ නිශ්චය කොට දැක්වෙන පරිදි වූ ව්‍යාපාරයක නියුක්ත යම් තැනැත්තකුගේ 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබූ යම් ලාභ සහ ආදායම් නොවන) ලාභ සහ ආදායම, ඒ ව්‍යාපාරයෙන් ඒ තැනැත්තා ලාභ ඉපයීම ආරම්භ කරන තක්සේරු වර්ෂයෙන් ආරම්භ වන අවුරුදු තුනක කාලසීමාවකට හෝ වාණිජ කටයුතු ආරම්භ කළ දිනයේ සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකකට වඩා පසුව නොවන

යම් තක්සේරු වර්ෂයකින් ආරම්භ වන අවුරුදු තුනක කාලසීමාවකට යන මෙයින් පළමුව එළඹෙන කාලසීමාව සඳහා ආදායම් බද්දෙන් නිදහස් වන්නේ ය.

(2) ලියාපදිංචි කිරීමේ දින සිට අවුරුදු දහයක කාලයක් සඳහා වලව් නිවාසවල හෝ විශේෂ සංවර්ධිත බංගලාවල සංචාරකයන්ට නවාතැන් පහසුකම් ලබාදීම සඳහා වූ යෝජනා ක්‍රමය යටතේ 2003 අප්‍රේල් මස 1 වන දින හෝ ඒදිනට පසුව 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත මගින් පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලය සමග ලියාපදිංචි වූ යම් තැනැත්තකුට (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.".

11. 2003 අංක 19 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ඉ) 2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා (මේ වගන්තිය යටතේ අඩු කරනු ලැබිය හැකි, ඔහු විසින් 2003 අප්‍රේල් 1 වන දිනට පෙර යම් කාලසීමාවක සිට දරන ලදුව ඉදිරියට ගෙන ආ අලාභයක් නොවන) යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක අලාභ මුදල පහත දැක්වෙන පරිදි අඩුකරගනු ලැබිය යුතු ය :-

(i) වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් සිදු වූ අලාභ වෙළෙඳාම හෝ ව්‍යාපාරවල ව්‍යවස්ථාපිත ආදායමින් ;

(ii) වෘත්තියකින් සිදු වූ අලාභ වෘත්තිය ව්‍යවස්ථාපිත ආදායමින් ;"

(iii) රක්ෂාවකින් සිදු වූ අලාභ රක්ෂාවක ව්‍යවස්ථාපිත ආදායමින්,

අඩුකර ගත නොහැකි යම් අලාභයක ශේෂයක් ඉදිරියට ගෙන ගොස් ඊළඟ තක්සේරු වර්ෂයේ දී අඩුකර ගැනීම යනාදී වශයෙන්, මේ වගන්තිය යටතේ අලාභ ඉදිරියට ගෙනයාම පිළිබඳ සීමාකිරීම්වලට යටත්ව, ඉහත සඳහන් කළ පරිදි ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩුකර ගත හැකි ය :

එසේ වුවද -

(i) එම අලාභයෙන් 23 වන වගන්තිය යටතේ අඩු කළ නොහැකි යම් වාර්ෂික ගෙවීමක්, බිම් කුලියක්, රාජ්‍ය භාගයක් හෝ පොලියක් වැඩිපුර ගෙවීම නියෝජනය වන්නේ නම් ;

(ii) එම අලාභයෙන් 23 වන වගන්තිය යටතේ ක්ෂය කිරීම් සඳහා හෝ අලුත් කිරීමේ පිරිවැය සඳහා හෝ ඉඩහැරීමක් නියෝජනය වන්නේ නම් ;

(iii) එම අලාභය අඩුකළ හැකි මුළු ව්‍යවස්ථාපිත ආදායම එම තක්සේරු වර්ෂය සඳහා රුපියල් මිලියනයක් නොඉක්මවන්නේ නම් ;

ඉහත දැක්වෙන විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(2) ඒ වගන්තියේ (1ආ) උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(1ඇ) යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමට, යම් රජයේ ආයතනයකින්, 2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව XVIආ පරිච්ඡේදයට අනුකූලව ආදායම් බදු අඩුකරගෙන තිබෙන-

(අ) තොරතුරු සපයන්නකු වශයෙන් තිළිණ ගෙවීමේ ක්‍රමයක් යටතේ ඒ තැනැත්තාට ලැබුණු යම් තෑගි මුදලක් ;

(ආ) යම් දඩ මුදලක කොටසක් බෙදාහැරීම සඳහා වූ යෝජනා ක්‍රමයක් යටතේ ඒ තැනැත්තාට ලැබුණු දඩ මුදල් කොටසක්,

ඇතුළත් නොවිය යුතු ය. '' ;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ ''අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ ඒ අවුරුදු හයේ හෝ අවුරුදු එකොළහේ කාලය තුළ යම් තක්සේරු වර්ෂයක ඔහුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කරනු නොලැබුවා වූ ද මුදලක් වන්නේ නම් ඒ මුදල අඩු කරනු ලැබිය යුතු ය.''; යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

''මේ පනත යටතේ ඒ අවුරුදු හයේ කාලය හෝ අවුරුදු එකොළහේ කාලය තුළ යම් තක්සේරු වර්ෂයක ඔහුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කරනු නොලැබුවා වූ ද මුදලක් වන්නේ නම් ඒ මුදල අඩු කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද (ආ) සහ (ඇ) ඡේදවල කවර විධිවිධානයක් තිබුණ ද, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා යම් නිශ්චිත ක්‍රියාකරකමක වැදගත්කම සැලකිල්ලට ගෙන, ඒ ක්‍රියාකාරකමට අදාළව අලාභයක් ඉදිරියට ගෙන යා හැකි උපරිම කාලසීමාව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය ; සහ

(4) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ ''හෝ 20 වන වගන්තිය '' යන වචන හා ඉලක්කම් වෙනුවට ''හෝ 20 වන වගන්තිය හෝ 21අ වන වගන්තිය හෝ 21ආ වන වගන්තිය හෝ 21ඇ වන වගන්තිය හෝ 21ඈ වන වගන්තිය හෝ 21ඉ වන වගන්තිය හෝ 21ඊ වන වගන්තිය,හෝ 21උ වන වගන්තිය හෝ 21ඌ වන වගන්තිය'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

12. 2002 අංක 10 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) (ඒ) ඡේදයේ "ලබාගත් ණය මුදලක් අදහස් වේ." යන වචන වෙනුවට "ලබාගත් ණය මුදලක් අදහස් වේ ;"; යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ඒ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

"(ඔ) 21උ වගන්තිය යටතේ අවුරුදු පහක කාලසීමාවකට ආදායම් බද්දෙන් නිදහස් කර තිබෙන සමාගමක් විසින් නිකුත් කරන ලද සාමාන්‍ය කොටස්වල, එසේ කොටස් නිකුත් කිරීමේ දී, යම් තක්සේරු වර්ෂයක් සඳහා ආයෝජනය කර තිබෙන මුදල් ප්‍රමාණය රුපියල් ලක්ෂ පහකට අඩු නොවන අවස්ථාවක, එසේ සාමාන්‍ය කොටස්වල ආයෝජනය කර තිබෙන මුදල් ප්‍රමාණයෙන් සියයට පණහක්. ";

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ-

(අ) (අ) ඡේදයේ -

(i) (iv) වන අනුඡේදයේ "රුපියල් එක් ලක්ෂයක් යන මේ දෙකින් වඩා අඩු මුදල නොඉක්මවිය යුතු ය." යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක් යන මේ දෙකින් වඩා අඩු මුදල නොඉක්මවිය යුතු ය ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (vi) වන අනුඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(vii) ඒ තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් කරන ලද (2)

උපවගන්තියේ (ඔ) ඡේදයේ සඳහන් යම් සුදුසුකම් ලැබීමේ ගෙවීමක් වෙනුවෙන්, ඔහුගේ තක්සේරු කළහැකි ආදායමෙන් තුනෙන් එකක් හෝ එකී සුදුසුකම් ලැබීමේ ගෙවීම යන මෙයින් වඩා අඩු මුදල නොඉක්මවිය යුතු ය.'' ;

(ආ) (ආ) ඡේදයේ,-

(i) (i) වන අනුඡේදයේ ''(ආ) සහ (ඔ) අනුඡේදවල'' යන වචන සහ අකුරු වෙනුවට ''(ආ), (ඌ) සහ (ඔ) අනුඡේදවල'' යන වචන සහ අකුරු ආදේශ කිරීමෙන් ;

(ii) (ii) වන අනුඡේදයේ ''රුපියල් මිලියන දහයක් නොඉක්මවිය යුතු ය'' යන වචන වෙනුවට ''රුපියල් මිලියන දහයක් නොඉක්මවිය යුතු ය ;'', යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) (iii) (ii) වන අනුඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :-

''(iii) යම් සමාගමක් විසින් කරන ලද (2) වන උපවගන්තියේ (ඔ) ඡේදයේ සඳහන් සුදුසුකම් ලැබීමේ ගෙවීමක් සම්බන්ධයෙන් වන විට, එය එහි තක්සේරු කළහැකි ආදායමෙන් පහෙන් එකක් හෝ එම සුදුසුකම් ලැබීමේ ගෙවීම යන මෙයින් අඩු මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.''.

**13.** 2002 අංක 10 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

අතුරු විධානයේ "(3) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති" යන වචනවල සිට එම අතුරු විධානයේ අග දක්වා ඇති වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

"ඒ මුදල—

(i) 2002 අප්‍රේල් 1 වන දිනට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ විට උපරිම වශයෙන් සියයට විසිපහක අනුප්‍රමාණය මත බදු අයකරනු ලැබිය යුතු ප්‍රාග්ධන ලාභයක් වේ ;

(ii) 2002 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ විට පළමුවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන තිසි අනුප්‍රමාණය අනුව බදු අය කරනු ලැබිය යුතු සේවා නියුක්ති අදායමක් වේ. "

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ "සියයට දහයක අනුප්‍රමාණය අනුව" යන වචන වෙනුවට "මේ පනතේ හයවන උපලේඛණයේ නිශ්චිතව දැක්වෙන තිසි අනුප්‍රමාණය අනුව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය මෙසේ සංශෝධනය කරනු ලැබේ :-

(1) එම උපවගන්තියේ (අ) ඡේදයේ "සියයට පහළොවක අනුප්‍රමාණය අනුව" යන වචන වෙනුවට" 2003 අප්‍රේල් 1 දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට පහළොවක අනුප්‍රමාණය අනුව සහ "2003 අප්‍රේල් 1 වන දිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මෙම පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන තිසි අනුප්‍රමාණ අනුව" යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ, සහ

(2) 14 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ ;

තව ද,

(2) එම උපවගන්තියේ (අ) ඡේදයේ "සියයට පහළොවක" යන වචන වෙනුවට "සියයට දහයක" යන වචන ආදේශ කිරීමෙන්. ",

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය, එහි "සියයට පහළොවක අනුප්‍රමාණය අනුව" යන වචන වෙනුවට "මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන තිසි අනුප්‍රමාණය අනුව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය, එහි "සියයට පහළොවක අනුප්‍රමාණයක් අනුව" යන වචන වෙනුවට "මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සියයට පහළොව බැගින් වූ අනුප්‍රමාණය අනුව" යන වචන වෙනුවට "මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "සියයට පහළොවක අනුප්‍රමාණය අනුව" යන වචන වෙනුවට "මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව" යන වචන ආදේශ කිරීමෙන්. ".

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය, එහි "සියයට පහළොවක අනුපාතිකයක් මත" යන වචන වෙනුවට "මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් ලාභ සහ ආදායම් ඇතුළත් වන්නේ නම්" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා ඇති වචන වෙනුවට, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, එම නිශ්චිත ලාභ, මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චතව සඳහන් තිසි අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කරගනු ලැබිය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සියයට පහළොවක අනුප්‍රමාණය අනුව" යන වචන වෙනුවට "මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන තිසි අනුප්‍රමාණය අනුව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සියයට විස්සක අනුප්‍රමාණය අනුව" යන වචන වෙනුවට "මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අනුප්‍රමාණ අනුව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "සියයට පහළොවක අනුප්‍රමාණය අනුව" යන වචන වෙනුවට "පනතේ හයවන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණය අනුව" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තිය අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :-

"(3) මේ පනතේ කුමක් සඳහන් වුව ද, 21ඉ වගන්තියේ සඳහන් යම් සමාගමක ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබුවේ යම් කාලසීමාවක් තුළ ද, එම කාලසීමාව අවසන් වීමෙන් පසුව ආරම්භ

වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව එම සමාගමේ ලාභ සහ ආදායම මත-

(අ) එම සමාගම මේ පනතේ 40 වන වගන්තියේ සඳහන් යම් ව්‍යවසායක හෝ සාම්ප්‍රදායික නොවන භාණ්ඩ අපනයනය කිරීමෙහි යෙදී සිටින්නේ නම් හෝ යෙදී සිටින බවට සලකනු ලබන්නේ නම්, මේ පනතේ හයවන උපලේඛනයේ අංක 7, 12, හෝ 14 වන අයිතම යටතේ නිශ්චිතව දැක්වෙන උචිත අනුප්‍රමාණය අනුව ;

(ආ) එම සමාගම, ඉහත (අ) ඡේදයේ සඳහන් ව්‍යවසායක් සහ කටයුතු හැර වෙනත් යම් ව්‍යවසායක යෙදී සිටින සමාගමක් නම්, මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උචිත අනුප්‍රමාණය අනුව,

ආදායම් බදු අයකර ගත යුතු ය.".

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) (II) වන අයිතමයේ "සියයට පහළොවක අනුප්‍රමාණය අනුව විය යුතු ය.". යන වචන වෙනුවට "සියයට පහළොවක අනුප්‍රමාණය අනුව විය යුතුය:" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තිය අගට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"එසේ වුව ද, 2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා (අ) සහ (ආ) අනුඡේදවල සඳහන් යම් ලාභාංශයක් වෙනුවෙන් මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නියි අනුප්‍රමාණය අනුව ආදායම් බදු අයකරනු ලැබිය යුතු ය.". යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "සියයට පහළොවක් විය යුතු ය." යන වචන වෙනුවට "2003 අප්‍රේල් 1 වන දිනට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට පහළොවක අනුප්‍රමාණයක් අනුව සහ 2003 අප්‍රේල් 1 වන දින දී හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව විය යුතු ය. ". යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ " යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන වෙනුවට "2003 අප්‍රේල් 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන වෙනුවට, "2003 අප්‍රේල් 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ, " යම් සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම ඇතුළත් වන්නා වූ" යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා වූ වචන වෙනුවට, "යම් සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම ඇතුළත් වන්නා වූ අවස්ථාවක, එම ආදායමෙන් මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව ආදායම් බදු අයකර ගනු ලැබිය යුතු ය. " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ "සියයට පහළොවක අනුප්‍රමාණය මත" යන වචන වෙනුවට "මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අනුප්‍රමාණ මත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ, "යම් සුදුසුකම් ලැබූ ලාභ සහ ආදායම ඇතුළත් වන්නා වූ " යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා ඇති වචන වෙනුවට "යම් සුදුසුකම්

ලැබූ ලාභ සහ ආදායම ඇතුළත් වන්නා වූ අවස්ථාවක, ඒ ආදායම මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණ අනුව ආදායම් බද්දට යටත් කරනු ලැබිය යුතු ය. '' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ, ''සියයට පහළොවක අනුප්‍රමාණය මත'' යන වචන වෙනුවට ''මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය මත'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ ''සියයට පහළොවක අනුප්‍රමාණයන් විය යුතු ය''; යන වචන වෙනුවට ''සියයට පහළොවක අනුප්‍රමාණයක් විය යුතු ය;'';

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

''එසේ වුව ද, 2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළ හැකි (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් යම් ලාභාංශයක් මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අනුප්‍රමාණ අනුව බද්දට යටත් කරනු ලැබිය යුතු ය''. ;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ ''සියයට පහළොවක අනුප්‍රමාණය විය යුතු ය.''; යන වචන වෙනුවට ''සියයට පහළොවක අනුප්‍රමාණයක් විය යුතු ය; '' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

''එසේ වුව ද, 2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු

අයකළ හැකි (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් යම් ලාභාංශයන්, මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අනුප්‍රමාණ අනුව බද්දට යටත් කරනු ලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වගන්තියේ, "කොටස් හෝ ණයපත්‍ර ආකාරයෙන්" යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා ඇති වචන වෙනුවට මෙහි පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"2002 අප්‍රේල් මස 1 වැ: දින හෝ ඉන්පසු ව-

(i) මුදලින් හෝ මුදල් ගෙවීමේ අණකරයක ආකාරයෙන් නොවන ;

(ii) බදු අඩුකර ගැනීමට හිමිකම තිබෙන හෝ නොමැති වෙනත් යම් සමාගමකින්, 61 වන වගන්තියේ (1අ) උපවගන්තිය යටතේ බදු අයකර ගැනීමකින් තොරව ලැබුණු, II වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් ලාභාංශයක්, නොවන ලාභාංශයක්,

ඇතුළත් වන අවස්ථාවක ඒ ලාභාංශයෙන් ලැබෙන ආදායම මත මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අනුප්‍රමාණය අනුව බදු අය කළ යුතු ය.";.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48ආ වන අළුත් වගන්තිය ඇතුළත් කිරීම.

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වගන්තියට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 48ආ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"ශ්‍රී ලංකාවට පිටතින් ලැබුණු ලාභාංශ සඳහා ආදායම් බදු අනුප්‍රමාණය.

48ආ. 2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ බදු අයකළ හැකි ආදායමට ශ්‍රී ලංකාවට පිටතින් ලැබුණු ලාභාංශයක් ඇතුළත් වන අවස්ථාවක, එම ආදායම මත, ද්විත්ව බදු

අයකිරීම වැළැක්වීම සඳහා පවත්නා යම් ගිවිසුමක විධිවිධානවලට යටත් ව, එම ලාභාංශ නියෝජනය කරන බදු අය කළ හැකි ආදායමෙන් මෙම පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අනුප්‍රමාණය අනුව බදු අයකරනු ලැබිය යුතු ය.".

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) (තොග වශයෙන් වන කළු තේ, ක්‍රේප් රබර්, ෂීට් රබර්, ස්ක්‍රැප් රබර්, රබර් කිරි හෝ අලුත් පොල් හැර) ඒ නිශ්චිත ව්‍යවසාය විසින් වැඩිමනක් නිෂ්පාදනය කිරීමක් නොමැතිව අපනයනය කිරීම සඳහා යම් වෙළෙඳ ද්‍රව්‍යයක් ;".

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "මේ වගන්තියේ මතු සඳහන් විධිවිධානවලට අනුකූලව" යන වචන වෙනුවට " මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණ අනුව" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන හා (3) වන උපවගන්ති ඉවත් කිරීමෙන්.

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (I) වන උපවගන්තියේ "මේ වගන්තියේ මතු සඳහන් විධිවිධානවලට අනුකූලව" යන වචන වෙනුවට, "මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි. අනුප්‍රමාණ අනුව" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) (අ) ඡේදයේ (II) වන උපඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන් :—

"(II) තොග වශයෙන් වූ කළු තේ, ක්‍රේප් රබර්, ෂීට් රබර්, ස්ක්‍රැප් රබර්, රබර් කිරි හෝ අලුත් පොල් අපනයනය කිරීමෙන් ලබාගත්තේ හෝ නොගත්තේ වුව ද, ලබාගත හැකි වූ යම් මුදල් ප්‍රමාණයක් ; හෝ "

(2) ඒ වගන්තියේ "මේ වගන්තියේ කාර්ය සඳහා සාම්ප්‍රදායික නොවන භාණ්ඩ" යන වචනවල "සිට වෙළෙඳ ද්‍රව්‍යයක් නොවන භාණ්ඩ අදහස් වේ." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"මේ වගන්තියේ කාර්ය සඳහා සාම්ප්‍රදායික නොවන භාණ්ඩ" යන්නෙන්, තොග වශයෙන් වූ කළු තේ, ක්‍රේප් රබර්, ෂීට් රබර්, ස්ක්‍රැප් රබර්, රබර් කිරි හෝ අලුත් පොල් හැර අනෙක් භාණ්ඩ අදහස් වේ. ".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 52අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 52අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"9 වන වගන්තියේ (අ), (ආ) උපවගන්ති යටතේ සේවා නියුක්ති ආදායම ආදායම් බද්දෙන් නිදහස් කර ඇති පුද්ගලයකු විසින් බදු අයකළ හැකි ආදායම වෙනුවෙන් ආදායම් බදු ගෙවීම.

52අ. (1) 2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ, (අ) සහ (ආ) ඡේදවල සඳහන් යම් පුද්ගලයකු එකී වගන්ති යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ තිබෙන ඔහුගේ සේවා නියුක්තියෙන් ලබන්නා වූ ලාභ සහ ඊට අමතරව ආදායම් බදු අයකරනු ලැබිය හැකි වෙනත් යම් ලාභ සහ ආදායම් ලබන්නා වූ අවස්ථාවක මේ පනතේ වෙනත් කවර විධිවිධානයක් තිබුණ ද, ඒ තැනැත්තා ලබන ආදායම් බදු අයකරනු ලැබිය හැකි ආදායම වෙනුවෙන් ගෙවිය යුතු බද්ද, මෙහි පහත දැක්වෙන පරිදි ගණන් බැලිය යුතු ය.

(2) 2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා එවැනි යම් පුද්ගලයකුගේ ව්‍යවස්ථාපිත ආදායමට, මේ වගන්තියේ විධිවිධානවලට යටත් නොවිය යුතු 4 (1) (ඇ) වගන්තියේ සඳහන් ප්‍රතිලාභ හැර ආදායම් බදු අයකළ හැකි ආදායම, පාරිශ්‍රමික සහ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් වෙනත් ප්‍රතිලාභ ද ඇතුළත් විය යුතු ය.

(3) එක් එක් වර්ෂයේ ඒ පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායම සහ බදු අයකළ හැකි ආදායම පිළිවෙලින් 29 වන වගන්තියේ සහ 30 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි නිශ්චය කළ යුතු ය.

(4) එක් එක් තක්සේරු වර්ෂයේ එම බදු අයකළ හැකි ආදායම මත ආදායම් බද්ද මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන බදු අනුප්‍රමාණවලට අනුකූලව ගණන් බැලිය යුතු ය.

(5) වෙනත් බදු බැර වාසියක් දීමට ප්‍රථම, මේ පනත යටතේ එක් එක් තක්සේරු වර්ෂය සඳහා තිබෙන වෙනත් බදු බැර වාසිවලට අමතරව පහත දැක්වෙන පරිදි ගණන් බලනු ලබන විශේෂ සේවා නියුක්ති බදු බැර වාසියක් දෙනු ලැබිය යුතු ය.

(6) (අ) විශේෂ සේවා නියුක්ති බදු බැර ගණනය කිරීමේ කාර්ය සඳහා අදාළ තක්සේරු වර්ෂයේ මුළු ව්‍යවස්ථාපිත ආදායම ලෙස (2) වන උපවගන්තියේ සඳහන් කර ඇති පරිදි ගණන් බලන ලද 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් බද්දෙන් නිදහස් සේවානියුක්ති ආදායම සැලකිල්ලට ගත යුතු වන අතර එම වර්ෂය සඳහා 29 වන වගන්තිය යටතේ

ඉඩදිය හැකි අඩුකිරීම් සහ 30 වන වගන්තිය යටතේ එම තැනැත්තාට එම වර්ෂය සඳහා හිමි දීමනා එම මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩුකළ විට ශේෂය (ඇත්නම්) බදු අයකළ හැකි ආදායම් ලෙස සලකා පළමුවන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන අනුප්‍රමාණ අදාළ කරගෙන ඒ අනුව එම බදු අයකළ හැකි ආදායම මත බද්ද ගණනය කළ යුතු ය. ;

(ආ) එසේ ගණනය කළ බදු මුදල විශේෂ සේවා නියුක්ති බදු බැර ලෙස සැලකිය යුතු ය.

(7) (6) වන උපවගන්තිය අනුව ගණන් බලනු ලබන මුළු බදු මුදල් ප්‍රමාණය, විශේෂ සේවානියුක්ති බදු බැර වාසිය විය යුතු අතර, වෙනත් බද්දකට යටත් ආදායම මත හිමි බදු බැරක් අඩුකිරීමට පෙර එය අඩුකළ යුතු ය.

(8) මෙම විශේෂ සේවා නියුක්ති බදු බැර වාසියේ අතිරික්තයක් ඇත්නම් එය ආපසු නොගෙවිය යුතු ය. ''

ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම.

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තියේ (1) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි ''ඇතුළත් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය. '' යන වචන වෙනුවට ''ඇතුළත් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය ; '' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ ඡේදය අවසානයට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

''(ඉ) 2003 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට තිහකට වඩා අඩු නොවන අනු ප්‍රමාණයකට

මේ වගන්තියේ (1) වන ඡේදය යටතේ ආදායම් බදු ගෙවීමට යම් සමාගමක් යටත් වන අවස්ථාවක එම සමාගමේ බදු අය කළ හැකි ආදායමෙන් සියයට දෙකහමාරකට සමාන මුදලක්, ආණ්ඩුව විසින් පිහිටුවනු ලැබූ මානව සම්පත් ප්‍රතිලාභ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මානව සම්පත් ප්‍රතිලාභ අරමුදල පිහිටුවනු ලබන තුරු, එම බදු මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. ".

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියෙහි (ආ) ඡේදයෙහි-

(අ) "ඒ තක්සේරු වර්ෂයෙහි" යන වචන වෙනුවට "යම් තක්සේරු වර්ෂයක් 2003 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, එම තක්සේරු වර්ෂය තුළ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ඡේදයේ (ii) වන උපඡේදයෙහි "නවයෙන් එකකට සමාන මුදලකින් සමන්විත විය යුතු ය." යන වචන වෙනුවට "නවයෙන් එකකට සමාන මුදලකින් සමන්විත විය යුතු ය; " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්-

"(ඇ) යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ ප්‍රේෂණ තිබෙන්නා වූ සහ ඒ තක්සේරු වර්ෂය 2003 අප්‍රේල් 1 වන දින දී හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන්නා වූ අවස්ථාවක, ඒ සමාගමේ ප්‍රේෂණවල එකතුවෙන් සියයට දහයකට සමාන මුදලකින් "; සහ

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ ''සමාගම් එහි ලාභවලින්'' යන වචන වෙනුවට ''සමාගමේ බදු අයකළ හැකි ලාභ හා ආදායම සහ ශ්‍රී ලංකාවේ දී ලබන ලාභවලින් බදු අයකරනු ලැබීමට යටත් ඒ සමාගම ශ්‍රී ලංකාවෙහි කරගෙන යන යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් වෙනුවෙන් ඒ සමාගම විසින් හෝ වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත දී ලබන යම් මුදල් ප්‍රමාණයක් ;

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (1අ) උපවගන්තියේ ''අඩුකර ගැනීමට හිමිකම තිබිය යුතු ය.'' යන වචන වෙනුවට ''(8 (අ) වගන්තියේ (ix), (xi), (xv), (xvii), (xx), (xxi), (xxxix), (Liv), (Lxiv), (Lxv), (Lxvi), (Lxxii), (Lxxiii) සහ (Lxxiv) යන අයිතමවල සඳහන් යම් ආයතනයකට ගෙවිය යුතු යම් ලාභාංශය ද හැර) අඩු කර ගත යුතු ය'' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ–

(අ) ඒ උපවගන්තියේ අතුරු විධානයේ (ආ) ඡේදයේ ''විටෙක, ඒ ලාභාංශයට හෝ ඒ සම්බන්ධයෙන් ; හෝ'' යන වචන වෙනුවට ''විටෙක, ඒ ලාභාංශයට හෝ ඒ සම්බන්ධයෙන් ; හෝ'' යන වචන ආදේශ කිරීමෙන්,

(ආ) ඒ වගන්තියේ (4) උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළු කිරීමෙන්,

''(ඇ) 2002 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව, වෙනත් යම් සමාගමකට, (1අ) උපවගන්තිය යටතේ ආදායම් බදු අඩුකර ගැනීමට යටත්ව ලැබුණු යම් ලාභාංශයක මුදලට හෝ ඒ සම්බන්ධයෙන්''.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 63අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**42.** ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 63අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය.

මෙම පරිච්ඡේදයේ විධිවිධාන පුණ්‍යායතන ආදියට අදාළ නොවිය යුතු බව.

63අ. මේ පරිච්ඡේදයේ විධිවිධාන, සංස්ථාවක් වන පුණ්‍යායතනයකට හෝ 96 වන වගන්තිය යටතේ තක්සේරු කරනු ලැබිය හැකි යම් කිසි පුද්ගල මණ්ඩලයකට අදාළ නොවිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කිරීම.

**43.** ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය, එහි (3) වන උපවගන්තියෙන් ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"(4) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයකට හෝ රීතියකට අනුකූලව, කොටස්, සුරැකුම්පත් හෝ වෙනත් ආයෝජනවල ආයෝජනය කිරීමේ ව්‍යාපාරයෙහි යෙදී සිටින යම් ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් මේ වගන්තියේ කාර්ය සඳහා යම් නිශ්චිත ක්ෂේත්‍රවල ආයෝජනය කරන ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තිය සංශෝධනය කිරීම.

**44.** ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තිය, එහි (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"(5) X වන පරිච්ඡේදයේ විධිවිධාන, ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන සහ මේ වගන්තිය යටතේ ආදායම් බදු සඳහා තක්සේරු කරනු ලැබිය හැකි යම් පුද්ගල මණ්ඩලයකට අදාළ නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 98 වන වගන්තිය සංශෝධනය කිරීම.

**45.** ප්‍රධාන ප්‍රඥප්තියේ 98 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "තක්සේරුකරුවකුට සැපයිය යුතු ය." යන වචන වෙනුවට "තක්සේරුකරුවකුට සැපයිය යුතු ය :" යන වචන ආදේශ කිරීමෙන්.

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :–

එසේ වුව ද, යම් තක්සේරු වර්ෂයක් සඳහා පුද්ගලයකුගේ ආදායම හුදෙක් පහත සඳහන් එකකින් හෝ කිපයක එකතුවකින් සමන්විත වන අවස්ථාවක එවැනි පුද්ගලයකු සම්බන්ධයෙන් ඉහතකී විධිවිධාන අදාළ නොවිය යුතු ය :–

(ඇ) මේ පනතේ 4 වන වගන්තියේ සඳහන් බදු පැනවිය හැකි සේවා නියුක්ති ආදායම රුපියල් භාරලක්ෂ විසිදහසක් නොඉක්මවනු, ලබන්නා වූ සහ එම දළ ලාභ හා ආදායමෙන් සේවායෝජක විසින් xiv වන පරිච්ඡේදය යටතේ ආදායම් බදු අඩුකර ඇත්තා වූ පුද්ගලයකුට ;

(ආ) බදු අයකර ගැනීමට යටත් ලාභාංශවලින් 61 වන වගන්තියේ (1අ) වන උපවගන්තිය යටතේ සියයට දහයේ අනුප්‍රමාණය අනුව ආදායම් බදු අඩු කරනු ලැබ ඇති විටෙක ;

(ඇ) බදු අයකර ගැනීමට යටත් පොලී ආදායමෙන් 122අ හෝ 122ආ වගන්ති යටතේ සියයට දහයක අනුප්‍රමාණය මත ආදායම් බදු අඩුකර ගෙන තිබෙන විටක ;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ, "තක්සේරුකරුවකු විසින්" යන වචන වෙනුවට "නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ;

"(4අ) යම් තැනැත්තකුට (4) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලැබුණු විට, ඒ තැනැත්තා විසින්, ඒ දැන්වීම ලැබී දවස් තිහක් ඇතුළත, අදාළ වාර්තාව තිසි වාර්තාවක් කිරීමට අවශ්‍ය විස්තර සපයනු ලැබුව හොත් ඒ වාර්තාව සම්බන්ධයෙන් ඉන් පසුව (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.".

(5) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරනු ලැබේ :-

"(5) යම් තැනැත්තකු විසින් යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කරගෙන යන්නා වූ හෝ ක්‍රියාත්මක කරන්නා වූ ද ඒ වෙළෙඳාමෙන්, ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් ලැබෙන ලාභ සහ ආදායම විවිධ අනුප්‍රමාණ අනුව බදු ගෙවීමට යටත් වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ එක් එක් ක්‍රියාකාරකමෙන් ලබන ලාභ සහ ආදායම වෙන වෙනම පිළිබිඹුවන පරිදි ගිණුම් පවත්වාගෙන ගොස් ගිණුම් වාර්තා සකස් කළ යුතු ය.".

(6) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "යම් තැනැත්තකුට දිය හැකි ය." යන වචන වෙනුවට "යම් තැනැත්තකුට දිය හැකි ය:" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"එසේ වුව ද, අදාළ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ පහක් ඉකුත් වූ පසුව තක්සේරුකරුවකු විසින් ඒ තැනැත්තාට එවැනි වාර්තා හෝ තොරතුරු සපයන ලෙස නියම නොකළ යුතු ය.".

(7) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ-

(අ) (ආ) ඡේදයෙහි "තක්සේරුකරු විසින් කළ හැකි ය." යන වචන වෙනුවට "තක්සේරුකරු විසින් කළ හැකි ය :" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන්-

"එසේ වුව ද, තක්සේරුකරුවකු විසින් දැන්වීමක්, අදාළ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ පහක් ඉකුත් වූ පසුව නිකුත් නොකළ යුතු ය.".

(8) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "ලිඛිත දැන්වීමක් කළ හැකි ය" යන වචන වෙනුවට "ලිඛිත දැන්වීමක් කළ හැකි ය :" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන්-

"එසේ වුව ද, තක්සේරුකරුවකු විසින් ඒ දැන්වීමක් අදාළ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ පහක් ඉකුත් වූ පසුව නිකුත් නොකළ යුතු ය.".

(9) ඒ වගන්තියේ (10) වන උපවගන්තියේ-

(අ) "භාරයෙහි රඳවාගත යුතු ය." යන වචන වෙනුවට "භාරයෙහි රඳවාගත යුතු ය :" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන්-

"එසේ වුව ද, තක්සේරුකරුවකු විසින් එසේ රඳවා තබා ගැනීම, අදාළ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ පහක් ඉකුත් වූ පසුව වලංගු නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තිය සංශෝධනය කිරීම.

**46.** ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලසීමාව" යන වචන වෙනුවට, "ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත, යම් තක්සේරු වර්ෂයක් සඳහා ව්‍යවස්ථාපිත ආදායම නිශ්චය කර ගැනීම පිණිස අවශ්‍ය විය හැකි සියලු විස්තර" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයෙහි-

(i) (අ) ඡේදයේ "ඉදිරිපත් කළ යුතු ය ; තව ද" යන වචන වෙනුවට "ඉදිරිපත් කළ යුතු ය :" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ අතුරු විධානයේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්-

"2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, (අ) අනුඡේදය තිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ රුපියල් මිලියන දෙසිය පණහකට නොඅඩු වාර්ෂික පිරිවැටුමක් සහිත හෝ වර්ෂයකට රුපියල් මිලියන එක් සියයකට නොඅඩු ශුද්ධ ලාභයක් සහිත වෙනත් යම් සමාගමක් හැර අන් කිසි සමාගමකට අදාළ නොවිය යුතු ය ; තව ද"

(iii) ඒ උපවගන්තියේ ඒ අතුරු විධානයේ (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

"2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා (ආ) අනුඡේදය, සමාගමක් නොවන තැනැත්තෙක් හා හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට රුපියල් මිලියන පනහකට අඩු වාර්ෂික පිරිවැටුමක් සහිත හෝ රුපියල් මිලියන විසිපහකට අඩු බෙදා දිය හැකි ලාභයක් සහිත හවුල් ව්‍යාපාරයකට හෝ වෙනත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට රුපියල් මිලියන විසිපහකට අඩු ශුද්ධ ලාභයක් සහිත තැනැත්තකුට අදාළ නොවිය යුතු ය.";

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්–

"2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් මිලියන දෙසිය පණහකට නොඅඩු වාර්ෂික පිරිවැටුමක් හෝ අවස්ථාවෝචිත පරිදි වර්ෂයකට රුපියල් මිලියන එක් සියයකට නොඅඩු ශුද්ධ ලාභයක් හෝ බෙදා දිය හැකි ලාභයක් සහිත, තිල ලැයිස්තුගත පොදු සමාගමකට හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට හෝ පමණක් මේ උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.".

(4) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ–

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "ගණකාධිකාරිවරයෙක් ; හෝ" යන වචන වෙනුවට "ගණකාධිකාරිවරයෙක් ; " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (iii) වන අනුඡේදයේ "යම් පුද්ගලයෙක්" යන වචන වෙනුවට "යම් පුද්ගලයෙක් ; හෝ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :–

"(iv) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි වී තිබෙන, සමුපකාර සමිතිවල විගණනය කිරීම සඳහා බලය දෙනු ලැබ තිබෙන විගණකවරයකු විසින්, අදාළ වර්ෂයේ පිරිවැටුම රුපියල් මිලියන පණහක් නොඉක්මවන එවැනි යම් සමුපකාර සමිතියක් හා සම්බන්ධව.";

(ඈ) ඒ උපවගන්තියේ (ආ) අනුඡේදයේ "මුදල් ප්‍රමාණය අදහස් වේ." යන වචන වෙනුවට "මුදල් ප්‍රමාණය අදහස් වේ ; සහ" යන වචන ආදේශ කිරීමෙන් :–

(ඉ) ඒ උපවගන්තිය අගට මෙහි පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :–

"(ඇ) "ශුද්ධ ලාභය" යන්න යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් යෙදෙන විට පිළිගත් වාණිජ පරිචයන් සහ ගණක ප්‍රමිතිවලට අනුකූලව නිශ්චය කර ගන්නා ලද ශුද්ධ ලාභය ඉන් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය සංශෝධනය කිරීම.

**47.** ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "අඩු කරන ලද ආදායම් බද්ද" යන වචන වෙනුවට "අඩු කර මේ පරිච්ඡේදයේ විධිවිධාන සලසා තිබෙන පරිදි කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරන ලද ආදායම් බද්ද" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

48. ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි අතුරු විධානයේ (ii) වන ඡේදයේ "සියයට පණහක් නොඉක්මවිය යුතු ය." යන වචන වෙනුවට "සියයට පණහක් නොඉක්මවිය යුතු ය ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ අතුරු විධානය අගට, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

"(iii) 2002 නොවැම්බර් 6 වන දින වන විට ගෙවිය යුතු ව තිබෙන යම් දණ්ඩන මුදලක්-

(අ) ගෙවීම පැහැර හැර තිබෙන බද්ද ඒ දිනයේ දී හෝ ඒ දිනයට පෙර ගෙවා ඇති අවස්ථාවක අත්හැර දැමිය යුතු ය ;

(ආ) ගෙවීම පැහැර හැර තිබෙන බද්දෙන් කොටසක් ඒ දිනයේ දී හෝ ඒ දිනයට පෙර ගෙවා ඇති අවස්ථාවක, එසේ ගෙවන ලද පැහැර හැර තිබුණු බදු මුදලේ කොටසට ආරෝපණය කළ හැකි එම දණ්ඩනයේ ප්‍රමාණානුකූල කොටස අතහැර දැමිය යුතු ය.".

49. ප්‍රධාන ප්‍රඥප්තියේ XVIඅ පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ XVIආ පරිච්ඡේදය ලෙස බලාත්මක විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් xviආ පරිච්ඡේදය ඇතුළත් කිරීම.

"XVIආ පරිච්ඡේදය

**ආණ්ඩුවේ ආයතනයක් විසින් තොරතුරු සැපයූ අයට ගෙවනු ලබන ත්‍යාග මුදල් වලින් සහ ආණ්ඩුව විසින් යම් තැනැත්තකුට ගෙවනු ලබන දඩ මුදල්වල කොටස්වලින් සහ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවන ලද ලොතරැයි ත්‍යාග වලින්, සූදු සහ ඔට්ටු ඇල්ලීමේ දිනුම් වලින් ආදායම් බදු අඩුකර ගැනීම.**

තෲාග හෝ දඩ හෝ ලොතරැයි දිනුම් ආදිය ගෙවන ආණ්ඩුවේ ආයතනයක් හෝ තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ආදායම් බදු අඩුකර ගත යුතු බව.

132අ. (අ) 2003 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආණ්ඩුවේ ආයතනයක් විසින් ත්‍යාග මුදලක් හෝ දඩ මුදල්වලින් කොටසක් ;

(ආ) යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ලොතරැයි ත්‍යාගයක්, සූදු සහ ඔට්ටු ඇල්ලීමේ දිනුමක්,

යම් තැනැත්තකුට ගෙවනු ලබන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි එම ත්‍යාග මුදල, දඩ මුදලේ කොටස, ලොතරැයි ත්‍යාගය, සූදු දිනුම් හෝ ඔට්ටු ඇල්ලීමේ දිනුම ගෙවනු ලබන අවස්ථාවේ දී, එම දළ මුදලින් සියයට දහයක අනුප්‍රමාණයට ආදායම් බදු අඩු කර ගත යුතු ය :

එසේ වුව ද, (ආ) ඡේදයේ සඳහන් මුදල් ගෙවීම් සම්බන්ධයෙන් වන විට, එම ගෙවීම් රුපියල් ලක්ෂ පහකට අඩු නොවූ අවස්ථාවල දී පමණක් එසේ බදු මුදල් අඩු කිරිම කළ යුතු ය:

එසේ ම තවදුරටත් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් මුදලින් හැර ලොතරැයි ත්‍යාගයක්, සූදු හා ඔට්ටු ඇල්ලීමේ දිනුමක් ගෙවනු ලබන අවස්ථාවක එම ලොතරැයි ත්‍යාග, සූදු හා ඔට්ටු ඇල්ලීම් දිනුම් මත අදළ ආදයම් බදු මුදල කොමසාරිස් ජනරාල්වරයාට ගෙවීමට එම තැනැත්තා යටත් විය යුතු ය.

මේ පරිච්ඡේදය යටතේ අඩු කිරීම් සම්බන්ධයෙන් XV පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු බව.

132ආ. (1) බැංකු සහ මුල්‍ය ආයතන විසින් ගෙවන ලද පොලියෙන් ආදායම් බදු අඩු කිරීමට, බැංකුවල සහ මුල්‍ය ආයතනවල කාර්ය, ආදායම් බදු අඩු කිරීමේ දී පැහැර හැරීම, බැංකු සහ මුල්‍ය ආයතන මත තක්සේරු කිරීම, අභියාචනා සහ පැහැර හැරීම සඳහා දණ්ඩන යන විෂයයන්ට අදාළ XV පරිච්ඡේදයේ විධිවිධාන, 132ආ වගන්තියේ සඳහන් පරිදි ත්‍යාග මුදල්වලින්, දඩ මුදල්වල කොටස්වලින්, ලොතරැයි ත්‍යාග මුදල් වලින්, සූදු දිනුම්වලින් සහ ඔට්ටු ඇල්ලීමේ දිනුම්

වලින් ආදායම් බදු අය කිරීමට, එම ත්‍යාග මුදල්, දඩමුදල්වල කොටස්, ලොතරැයි ත්‍යාග, සූදු දිනුම් හෝ ඔට්ටු ඇල්ලීමේ දිනුම් සඳහා මුදල් ගෙවන තැනැත්තන්ගේ හෝ හවුල් ව්‍යාපාරවල කාර්ය, ආදායම් බදු අඩු කිරීමේ දී පැහැර හැරීම, ඒ තැනැත්තන් හෝ හවුල් ව්‍යාපාර මත තක්සේරු නිකුත් කිරීම, අභියාචනා මේ පරිච්ඡේදය යටතේ පැහැර හැරීම සඳහා දණ්ඩනය යන විෂයයන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව XV පරිච්ඡේදයේ "බැංකු සහ මූල්‍ය ආයතන" යන වචන වෙනුවට "යම් ත්‍යාග මුදලක්, දඩ මුදලක කොටසක්, ලොතරැයි ත්‍යාග, සූදු දිනුමක් හෝ ඔට්ටු ඇල්ලීමේ දිනුම් ගෙවන යම් තැනැත්තෙක් හෝ හවුල් ව්‍යාපාරයක්" සහ "පොළිය" යන වචනය වෙනුවට "යම් ත්‍යාග මුදලක්, දඩ මුදලක කොටසක්, ලොතරැයි ත්‍යාග, සූදු දිනුමක් හෝ ඔට්ටු ඇල්ලීමේ දිනුමක්" යන වචන ඒ පරිච්ඡේදයේ යෙදෙන කවර හෝ විටෙක එලෙස ආදේශ කරනු ලැබූ ලෙස අදාළ විය යුතු ය.

"(2) (අ) (i) යම් ලිත් මාසයක් ඇතුළත යම් තැනැත්තකුට, ; ගෙවන ලද ත්‍යාග මුදල් ප්‍රමාණයේ මුළු එකතුව එක් ත්‍යාග මුදල් ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ගෙවීම මත ආදායම් බදු එක් එක් මාසයේ අවසාන වැඩ කරන දිනයේ දී අඩුකරගනු ලැබිය යුතු ය.

(ii) යම් මාසයක් තුළ යම් තැනැත්තකුට ගෙවන ලද දඩ කොටස් මුදල්වල මුළු එකතුව එක් දඩ මුදල් කොටසක් ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ ගෙවීම මත ආදායම් බදු එක් එක් මාසයේ අවසාන වැඩ කරන දිනයේ දී අඩු කරගනු ලැබිය යුතු ය.

(iii) එක් දිනකට යම් තැනැත්තකුට ගෙවන ලද සූදු දිනුම්වල හෝ ඔට්ටු ඇල්ලීමේ දිනුම්වල මුළු

එකතුව, සූදු දිනුම්වල හෝ ඔට්ටු ඇල්ලීමේ දිනුම්වල එක් ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ගෙවීම් මත ආදායම් බදු ඔහු එම දවස ඇතුළත දී අඩු කරගනු ලැබිය යුතු ය.

(ආ) ලොතරැයි ත්‍යාග සම්බන්ධයෙන් වන විට එකී එක් එක් ත්‍යාගය මුදලින් හෝ අන්‍යාකාරයකින් ගෙවනු ලැබුව ද ඒවා වෙන් වෙන් වශයෙන් වූ ත්‍යාග ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා -

"ත්‍යාග මුදල් ගෙවීම්" යන්නෙන්, තොරතුරු සපයන්නන්ට සහ වෙනත් අයට ත්‍යාග මුදල් ගෙවීම සඳහා යම් යෝජනා ක්‍රමයක් යටතේ ආණ්ඩුව විසින් පිරිනමනු ලබන තෑග්ගක් හෝ ගෙවනු ලබන ත්‍යාග මුදලක් අදහස් වේ.

"දඩ මුදලකින් කොටසක්" යන්නෙන්, අයකර ගන්නා ලද දඩ මුදල්වලින් කොටසක් ගෙවීම සඳහා වූ යෝජනා ක්‍රමයට අනුකූලව ආණ්ඩුව විසින් අයකර බෙදාහරිනු ලබන හෝ ගෙවනු ලබන දඩ මුදලකින් කොටසක් අදහස් වේ.

"ලොතරැයි ත්‍යාග මුදල්" යන්නෙන්, ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන යම් ලොතරැයියකින් ප්‍රදානය කරනු ලබන මුදල් හෝ අන්‍යාකාරයක යම් ත්‍යාගයක් අදහස් වේ.

"සූදු දිනුම්" යන්නෙන්, කැසිනෝ ඇතුළු යම් සූදුවක දී හෝ සූදු ක්‍රියාවක දී දිනුම සඳහා ලැබෙන යම් ගෙවීමක් අදහස් වේ.

"ඔට්ටු ඇල්ලීමේ දිනුම්" යන්නෙන්, තුරඟ තරඟ පිටියක් ඇතුළත දී හෝ ඉන් පිටත දී දිනුම් සඳහා ලැබෙන යම් ගෙවීමක් අදහස් වේ.

(4) 125 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුන ද-.

(අ) ලොතරැයි දිනුම්වලින් අඩුකර ගන්නා ලද සම්පූර්ණ බදු මුදල් ප්‍රමාණය, සතියේ පළමු දිනයේ දී කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, සතියේ එම පළමු දිනය වැඩ කරන දිනයක් නොවන අවස්ථාවක ඊළඟ වැඩ කරන දිනයේ දී ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය ;

තව ද, එම මුදල් ප්‍රමාණය, එකී ප්‍රේෂණය කළ දිනයට පෙරාතුව ම වූ ඉරිදා දිනයෙන් අවසන් වූ සතිය තුළ දී අඩු කර ගන්නා ලද බදු මුදලෙහි එකතුව විය යුතු ය ;

(ආ) සූදු ක්‍රීඩාවලින් හෝ ඔට්ටු ඇල්ලීමේ දිනුම් වලින් අඩු කර ගන්නා ලද සම්පූර්ණ බදු මුදල් ප්‍රමාණය සතියේ පළමු දිනයේ දී කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, සතියේ එම පළමු දිනය වැඩකරන දිනයක් නොවන අවස්ථාවක ඊළඟ වැඩ කරන දිනයේ දී ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, ප්‍රේෂණය කරනු ලැබිය යුතු එම මුදල් ප්‍රමාණය, එම ප්‍රේෂණය කළ දිනට පෙරාතුව ම වූ ඉරිදා දිනයෙන් අවසන් වූ සතිය ඇතුළත අඩුකර ගන්නා ලද බදු මුදලෙහි එකතුව විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තිය සංශෝධනය කිරීම.

**50.** ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තියේ, (5) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) එහි (ආ) ඡේදයේ "එකී වාර්තාව කරන ලද තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ හයක් ඉකුත්වීමෙන් පසුව" යන වචන වෙනුවට "හෝ ආදායම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර නැති අවස්ථාවක, එම වාර්තාව අදාළ වනුයේ නැතහොත් එම වාර්තාව ඉදිරිපත් කළ යුත්තේ යම් අදාළ තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ද, ඒ අදාළ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ පහක් ඉකුත් වීමෙන් පසුව" යන වචන ආදේශ කිරීමෙන්,

(2) ඒ උපවගන්තියේ දෙවන අතුරුවිධානයේ "ඒ තක්සේරු වර්ෂය අවසාන වීමෙන් පසු ඕනෑම අවස්ථාවක දී" යන වචන වෙනුවට "ඒ තක්සේරු වර්ෂය අවසාන වීමෙන් පසු වර්ෂ පහක් ඉකුත් වීමට පෙර" යන වචන ආදේශ කිරිමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තිය සංශෝධනය කිරිම.

**51.** ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "තක්සේරුකරුවකුගේ" යන වචන වෙනුවට "අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ යම් තක්සේරුකරුවකුගේ තක්සේරුවකට එරෙහිවද, ඒ තක්සේරුව කළ තක්සේරුකරු හැර වෙනත් තක්සේරුකරුවකුගේ යන වචන ආදේශ කිරීමෙන්.

(2) (13) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන උප ඡේදයෙහි "කොමසාරිස් ජනරාල්වරයා හෝ තක්සේරුකරුවකු නොවන වෙනත් යම් තැනැත්තකු විසින්," යන වචන වෙනුවට "කොමසාරිස් ජනරාල්වරයා හෝ තක්සේරුකරුවකු නොවන වෙනත් යම් තැනැත්තකු විසින් ;" යන වචන ආදේශ කිරීමෙන්.

(ආ) ඒ උපවගන්තිය අවසානයට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"එසේ වුව ද, 2003 අප්‍රේල් මස 1 වැනි දින හෝ ඊට පසු කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුනු අභියාචනයක් එය ලැබුනු දින සිට වර්ෂ දෙකක් ඇතුළත දී තීරණය කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 140 වන වගන්තිය සංශෝධනය කිරිම.

**52.** ප්‍රධාන ප්‍රඥප්තියේ 140 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (10) වන උපවගන්තියේ, "කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය." යන වචන වෙනුවට "කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය: "යන වචන ආදේශ කිරිමෙන් ;

(2) ඒ උපවගන්තිය අගට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :–

"එසේ වුව ද, ඒ අභියාචනයක් විභාග කිරීම ආරම්භ කළ දින සිට අවුරුදු දෙකක් ඇතුළත මණ්ඩලය විසින් අවස්ථාවෝචිත පරිදි එම අභියාචනය පිළිබඳ තීරණය දීම හෝ එහි මතය ප්‍රකාශ කිරීම කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, තවදුරටත් යම් අභියාචනයක් විභාග කිරීම මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භක දිනය වන විට ආරම්භ කර ඇති අවස්ථාවක, එම අභියාචනය පිළිබඳ තීරණය දීම හෝ ඒ පිළිබඳව මතය ප්‍රකාශ කිරීම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ සිට අවුරුදු දෙකක් ඇතුළත කරනු ලැබිය යුතු ය. ".

**53.** ප්‍රධාන ප්‍රඥප්තියේ 141 වන වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 141 වන වගන්තිය සංශෝධනය කිරීම.

(6අ) අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩුවේ තීරණයක් කරන තුරු කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක පදනම මත, ආරවුලට තුඩු දී ඇති බදු ප්‍රමාණය සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් අය කර ගත හැකි බදු ප්‍රමාණය සම්බන්ධයෙන්, අතුරු තීරණයක් කළ යුතු ය.

**54.** ප්‍රධාන ප්‍රඥප්තියේ 144 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 144 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඇති අතුරු විධානයෙහි-

(අ) ඒ අතුරු විධානයේ (ii) වන උපඡේදයේ "දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය." යන වචන වෙනුවට "දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.", යන වචන ආදේශ කිරීමෙන්.

(ආ) එහි (ii) වන උපඡේදය අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :–

"(iii) 2002 නොවැම්බර් මස 6 වන දින වන විට, කිසියම් දණ්ඩන මුදලක් ගෙවීමට ඇති අවස්ථාවක—

(අ) දණ්ඩන මුදල ගෙවනු ලැබිය යුත්තේ යම් බදු මුදලක් පැහැර හැරීම සම්බන්ධයෙන් ද ඒ බදු මුදල 2002 නොවැම්බර් මස 6 වන දින හෝ එදිනට පෙර ගෙවා ඇති අවස්ථාවක එම දණ්ඩන මුදල අත් හරිනු ලැබිය යුතු ය ;

(ආ) ගෙවීම පැහැර හැර ඇති බදු මුදලින් කොටසක් පමණක් 2002 නොවැම්බර් මස 6 වන දින හෝ එදිනට පෙර ගෙවා ඇති අවස්ථාවක, එම බදු මුදලට අදාළ වන එම දණ්ඩන මුදලේ අනුපාතික මුදල පමණක් අත්හරිනු ලැබිය යුතු ය." ;

(2) ඒ වගන්තියේ (12) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

(12අ) කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්හිටුවා තබන ලද යම් බදු මුදලක්, අභියාචනය තීන්දු කරනු ලැබූ විට සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ ගෙවිය යුතු වුවහොත් එවිට, එම අභියාචනය හා සම්බන්ධව 141 වන වගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත කරුණු සැලකිරීමක් කර ඇත්නම් මිස, ගෙවිය යුතු ව තිබෙන යම් මුදලක්, අභියාචනය තීන්දු කරනු ලැබූ දින සිට එක් අවුරුද්දක් ඇතුළත අයකර ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**55.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :–

"පළමුවන උපලේඛනය (32 වන වගන්තිය)

ආදායම් බදු අනුප්‍රමාණය-යම් දේපළ භාරගන්නන්, භාරකරුවන්, පොල්මංකරුවන්, හෝ ඇවරකරුවන් නොවන පුද්ගලයන්

I වන කොටස

11 වන කොටසේ සඳහන් කළ පුද්ගලයන් හැර අනෙක් පුද්ගලයන් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළ හැකි ආදායමෙහි –

| | |
|---|---|
| පළමුවන 100,000 සම්බන්ධයෙන් | සියයට 10 |
| ඊළඟ 100,000 සම්බන්ධයෙන් | සියයට 15 |
| ඊළඟ 100,000 සම්බන්ධයෙන් | සියයට 25 |
| බදු අයකළ හැකි ඉතිරි කොටස මත | සියයට 35 |

Iඅ වන කොටස

2002 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා –

| | |
|---|---|
| බදු අයකළ හැකි ආදායමෙහි පළමුවන 180,000 සම්බන්ධයෙන් | සියයට 10 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ 180,000 සම්බන්ධයෙන් | සියයට 20 |
| බදු අයකළ හැකි ආදයමේ ඉතිරි කොටස මත | සියයට 35 |

Iආ කොටස

2003 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ආදායමෙහි පළමුවන රු. 180,000 මත සියයට 10 බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 180,000 මත සියයට 20

| | |
|---|---|
| බදු අයකළ හැකි ආදායමේ ඉතිරි කොටස මත | සියයට 30 |

II වන කොටස

ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද 73 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ සහ 37(1) සහ (2) වගන්ති යටතේ නිර්වාසියකු ලෙස සලකනු ලබන්නා වූ ද පුද්ගලයකුට සියයට 15

III වන කොටස

(අ) 32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් සේවා නියුක්තියෙන් ලබන ඇතැම් ලාභවලට අදාළ විය යුතු ආදායම් බදු අනුප්‍රමාණය.

2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා

පළමුවන රු. 500,000 බදු ගෙවිය යුතු ආදායම සම්බන්ධයෙන් කිසිවක් නැත.

ඊළඟ රු. 150,000 බදු ගෙවිය යුතු ආදායම සම්බන්ධයෙන් සියයට 5
ඊළඟ රු. 150,000 බදු ගෙවිය යුතු ආදායම සම්බන්ධයෙන් සියයට 10

ඉතිරි කොටස සම්බන්ධයෙන් සියයට 15

(ආ) 32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් සේවානියුක්තියෙන් ලබන සෑම සේවා නියුක්තයකුට ම අදාළවන සමාන ක්‍රමයක් යටතේ සේවා යෝජක විසින් ගෙවා නැතිවිට ආදයම් බදු අනුපාතිකය–

1ඇ කොටස හෝ 1ආ කොටස ප්‍රකාර උපරිම; සියයට 20 ;

IIIඅ කොටස

32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් සේවා නියුක්තියෙන් ලබන ඇතැම් ලාභවලට අදාළ විය යුතු ආදයම් බදු අනුප්‍රමාණ

2002 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයන් සඳහා-

පළමුවන රු. 1,000,000 බදු ගෙවිය යුතු ආදායම සම්බන්ධයෙන් කිසිවක් නැත.

ඊළඟ රු. 500,000 බදු ගෙවිය යුතු ආදායම සම්බන්ධයෙන් සියයට 5
ඊළඟ රු. 500,000 බදු ගෙවිය යුතු ආදායම සම්බන්ධයෙන් සියයට 10

ඉතිරි කොටස සම්බන්ධයෙන් සියයට 15"

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**56.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :–

දෙවන උපලේඛනය

(53 සහ 70 වන වගන්ති)

සමාගම් – ආදයම් බදු අනුපාතික

I වන කොටස

2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා–

ඒකක භාරයක්, අන්‍යොන්‍ය අරමුදලක් ඇතුළු සමාගමක් සියයට 35

Iඅ කොටස

2002 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වූ තක්සේරු වර්ෂය සඳහා–
ඒකක භාරයක්, අන්‍යොන්‍ය අරමුදලක් ඇතුළු සමාගමක්–

තක්සේරු වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදයම රු. 5,000,000 නො ඉක්මවන්නේ නම් සියයට 20

තක්සේරු වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදයම රු. 5,000,000 ඉක්මවන්නේ නම් – සියයට 35

"Iඅ. කොටස

2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, හයවන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන අනුප්‍රමාණවලට යටත්ව, පහත දැක්වෙන අනුප්‍රමාණ අදාළ විය යුතු ය :–

| | |
|---|---|
| (තක්සේරු වර්ෂය තුළ දී සාමාජිකයන් 300 ක් හෝ 300කට වැඩි ප්‍රමාණයක් සිටින නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ අවදානම් ප්‍රාග්ධන සමාගමක් හෝ ඒකක භාරයක්, අන්‍යොන්‍ය අරමුදලක් හැර) එම තක්සේරු වර්ෂය තුළ දී සමාගමේ බදු අය කළ හැකි ආදායම රු. 5,000,000 ක් ඉක්මවන අවස්ථාවක දී. | (මානව සම්පත් ප්‍රතිලාභ අරමුදලට දයක මුදල වන සියයට 2.5 දායක මුදල් ඇතුළුව) සියයට 32.5 |
| තක්සේරු වර්ෂය තුළ සාමාජිකයන් 300ක් හෝ 300 කට වැඩි සංඛ්‍යාවක් සිටින සහ ඒ තක්සේරු වර්ෂයේ දී බදු අයකළ හැකි ආදායම රු. 5,000,000 ඉක්මවන නිල ලැයිස්‍තුගත පොදු සමාගමක්. | (මානව සම්පත් ප්‍රතිලාභ අරමුදලට දයක මුදලවන සියයට 2.5 දායක මුදල් ඇතුළුව) සියයට 30ක් |
| (ඒකක භාරයක්, අන්‍යොන්‍ය අරමුදලක් හෝ අවදානම් ප්‍රාග්ධන සමාගමක් නොවන) සමාගමේ බදු අයකළ හැකි ආදායම රු. 5,000,000 ක් නොඉක්මවන අවස්ථාවක. | සියයට 20 |
| අවදානම් ප්‍රාග්ධන සමාගමක් | සියයට 20 |
| ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් නිශ්චිත ක්ෂේත්‍රවල ලාභ | සියයට 10 |
| ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් නිශ්චිත ක්ෂේත්‍රවල ලාභ නොවන. | සියයට 20 |

**57.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එහි 1 වන අයිතමය වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් :–

"1. ඒකාබද්ධ හින්දු පවුල්"

| | |
|---|---|
| 2003 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා | සියයට 35 |
| 2003 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වූ තක්සේරු වර්ෂයක් සඳහා | සියයට 30 |

(2) එහි 2 වන අයිතමයේ, "පුණ්‍යායතන" යන වචන වෙනුවට "(සංස්ථාපිත මණ්ඩල ඇතුළු) පුණ්‍යායතන" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එහි 3 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"3. (අන්තිම කැමති පත්‍ර යටතේ භාරකරුවන් නොවන) පොල්මෑකරුවන් සහ (ඇවරකරුවන් නොවන)

2003 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 35

2003 අප්‍රේල් මස 1. වන දින හෝ එදිනට පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 30

(4) එහි 4 වන අයිතමය වෙනුවට, පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් –

"4. (අන්තිම කැමති පත්‍රය යටතේ භාරකරුවන් ඇතුළුව) භාරකරුවෝ

2003 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 35

2003 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 30

(5) එහි 5 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"හවුල් ව්‍යාපාර

2003 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 35

2003 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වූ තක්සේරු වර්ෂයක් සඳහා සියයට 30" ;

(6) එහි 9 වන අයිතමය වෙනුවට, පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"9. (ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එක්සත් රාජධානියේ ආණ්ඩුව නොවන) ආණ්ඩුවල බදු අයකළ හැකි ආදායම

2003 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 35

2003 අප්‍රේල් මස 1 දින හෝ එදිනට පසු ආරම්භ වූ තක්සේරු වර්ෂයක් සඳහා සියයට 30" ;

(7) එහි 10 වන අයිතමය වෙනුවට, පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"10. 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව සතු කරනු ලැබූ වෙළෙඳ ව්‍යාපාර–

2003 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයන් සඳහා සියයට 35

2003 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයන් සඳහා සියයට 30";

(8) එහි 13 වන අයිතමය වෙනුවට, පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"13. (ඉහත සඳහන් පළමුවන සහ දෙවන උපලේඛනවල සඳහන් නොවන) තැනැත්තන් –

2003 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 20

2003 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 30";.

**58.** ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන උපලේඛනය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය ලෙස බලාත්මක විය යුතු ය :-

ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනයට එකතු කිරීම.

"හයවන උපලේඛනය

පළමුවන, දෙවන හා තුන්වන උපලේඛනවල කවර අනුප්‍රමාණයක් නියමිතව තිබුණ ද මෙහි පහත දැක්වෙන අනුප්‍රමාණ අදාළ විය යුතු ය :–

| | |
|---|---|
| 1. ආණ්ඩුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් වෙත සතු කරන ලද දේපළ සම්බන්ධයෙන් ගෙවිය යුතු වන වන්දිය මත වූ සම්පූර්ණ පොලී මුදල මත අයකළ යුතු ආදායම් බදු අනුප්‍රමාණය. (33 වන වගන්තිය) | සියයට 10 |
| 2. ඇතැම් බැංකු තැන්පතු වලින් ලැබෙන සම්පූර්ණ පොලී මුදල මත අයකළ යුතු ආදායම් බදු අනුප්‍රමාණය (34 වන වගන්තිය) | සියයට 10 |
| 3. ශ්‍රී ලංකාවෙන් පිටත සමාගම්, හවුල් ව්‍යාපාර සහ පුද්ගල මණ්ඩල විසින් දෙන ලද ණය පිළිබඳ දළ පොලිය මත ආදායම් බදු අනුප්‍රමාණය (35 වන වගන්තිය) | සියයට 15 |
| 4. ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමකට, හවුල් ව්‍යාපාරයකට හෝ පුද්ගල මණ්ඩලයකට ගෙවිය යුතු රාජ්‍ය භාගය මත ආදායම් බදු අනුප්‍රමාණය (36 වන වගන්තිය) | සියයට 15 |
| 5. යම් විදේශීය ව්‍යාපාර මුදල් බැංකු ඒකකයක විදේශ ව්‍යවහාර මුදලින් සිදුකරන "මෙතෙර" ගනුදෙනුවකින් උපදින ලාභ සහ ආදායම් මත ආදායම් බදු අනුප්‍රමාණය (38 වන වගන්තිය) | සියයට 15 |
| 6. සමාගමක් නොවන තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ ද 186 වන සහ 39 වන වගන්තිවල අර්ථ නිරූපණය කර ඇති පරිදි කෘෂිකර්මය, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ ඉදිකිරීම් වැඩ සඳහා වූ ව්‍යවසායකින් ලැබෙන ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය (39 වන වගන්තිය) | පළමුවන උප ලේඛනය අනුව නමුත්' සියයට 15ක උපරිමයකට යටත්ව. |
| 7. සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ ද 186 වන සහ 40 වන වගන්තිවල අර්ථ නිරූපණය කර ඇති පරිදි කෘෂිකර්මය, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ ඉදිකිරීම් වැඩ සඳහා වූ ව්‍යවසායකින් ලැබෙන ලාභ මත ආදායම් බදු අනු ප්‍රමාණය (40 වන වගන්තිය) | සියයට 15 |

| | |
|---|---|
| 8. විශේෂිත නිවාස බැංකුවලට අදාළ ආදායම් බදු අනුප්‍රමාණ (40අ වගන්තිය) | සියයට 20 |
| 9. 21අ වගන්තිය හෝ 21ඇ වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද ඇතැම් සමාගම්වලට එම බද්දෙන් නිදහස් කාලසීමාවට ඉක්බිතිව ම එළඹෙන අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා අදාළ වන අදායම් බදු අනුප්‍රමාණය (40 ආ වගන්තිය) | සියයට 10 |
| 10. ආදායම් බද්දෙන් නිදහස් කිරීම 21ආ හෝ 21ඇ වගන්තිය යටතේ වන අවස්ථාවක, එම බද්දෙන් නිදහස් කාලසීමාව අවසන් වීමෙන් පසුව ඇතැම් සමාගම්වලට අදාළ වන යම් ආදායම් බදු අනු ප්‍රමාණය (40 ආ වගන්තිය) | සියයට 15 |
| 11. ආදායම් බද්දෙන් නිදහස් කිරීම 21අ,. 21ඇ හෝ 21ඉ වගන්ති යටතේ වන සහ සියයට 10 හෝ සියයට 15 අනුප්‍රමාණය අදාළ නොවන අවස්ථාවක දී බද්දෙන් නිදහස් කාලසීමාව ඉකුත් වූ පසුව ඇතැම් සමාගම්වලට අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණය (40 ආ වගන්තිය) | සියයට 20 |
| 12. 40 වන වගන්තියට අනුකූලව බදු අයකළ හැකි ලාභ සහ ශ්‍රී ලංකාවට ආදයමෙන් ගෙවන ලද ලාභාංශවලට සහ ශ්‍රී ලංකාවට බැහැරින් ලැබී ඇති යම් ලාභාංශවලට සහ 48 අ වගන්තියේ සඳහන් වෙනත් ලාභාංශවලට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය (41 වන වගන්තිය 48(අ) සහ 48(ආ) වගන්තිය). | 2003 අප්‍රේල් මාසයේ දී හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 10 |
| 13. 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙර නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදයම් සම්බන්ධයෙන් වූ ආදයම් බදු අනුප්‍රමාණය (44 වන වගන්තිය) | පළමුවන උපලේඛනය අනුව, නමුත් සියයට 15ක උපරිමයකට යටත් ව. |
| 14. 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙර නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක් නොවන තැනැත්තන්ගේ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදයම් සම්බන්ධයෙන් වූ ආදයම් බදු අනුප්‍රමාණය (44 වගන්තිය) | සියයට 15 |
| 15. 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙර නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන (සමාගමක් නොවන) තැනැත්තන්ගේ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදයම සම්බන්ධයෙන් වූ ආදයම් බදු අනුප්‍රමාණය (46 වගන්තිය) | පළමුවන උපලේඛනය අනුව, නමුත් සියයට 15ක උපරිමයකට යටත් ව. |

| | |
|---|---|
| 16. 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙර නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ආදායම් බදු අනුප්‍රමාණය (47 වන වගන්තිය) | සියයට 15 |
| 17. අපනයන ලාභ සහ ආදයම් වලින් ලැබෙන ලාභාංශ සම්බන්ධයෙන් ආදයම් බදු අනුප්‍රමාණය (48 වන වගන්තිය) | 2003 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 10 |
| 18. යම් නැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක සැළකුණු අපනයන සම්බන්ධයෙන් වූ ආදයම් බදු අනුප්‍රමාණය. (49 වන වගන්තිය) | පළමුවන උපලේඛනය අනුව සෑම පුද්ගලයකු සඳහා සියයට 15 ක උපරිමයකට යටත්ව සහ සමාගමක් සඳහා සියයට 15 |
| 19. යම් වාසික සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර සිදු කරන ලද සේවාවන්ගෙන් ලැබෙන ලාභ සහ ආදයම් සම්බන්ධයෙන් වූ ආදයම් බදු අනුප්‍රමාණය. (50 වගන්තිය) | කොටස්කරුවන් සම්බන්ධයෙන් වන විට පළමුවන උපලේඛනයට අනුව නමුත් සියයට 15 ක උපරිමයකට යටත්ව සියයට 15 |
| 20. යම් පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු විසින් විදේශීය ව්‍යවහාර මුදලින් උපයාගත් යම් පඩිනඩි සහ ගාස්තු මත වූ ආදයම් බදු අනුප්‍රමාණය. (51 වගන්තිය) | පළමුවන උපලේඛනය අනුව නමුත් සියයට 15 ක උපරිමයකට යටත් ව. |

අතීතයට බලපැවැත්වීම.

**59.** (අ) මේ පනතේ 9, 13 සහ 32 වන වගන්තිවලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ, 32 සහ 48අ යන වගන්තිවලට කරන ලද සංශෝධන, 2002 අප්‍රේල් මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් වගන්තිවලට හැර, මේ පනතින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 2003 අප්‍රේල් මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**60.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.